# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**9 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව - I/II

නම/ විභාග අංකය: ………………………………… කාලය පැය 2 යි

*ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.*

★ **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියා දක්වන්න.**

1) ලෝකයේ ………………………… සපයන ප්‍රමුඛ රටක් ලෙස පකිස්ථානය වැදගත් වේ.
(චික්පී/ අමු කපු/ තිරිඟු)
2) ශ්‍රී ලංකාවේ මුහුදු මට්ටමේ සිට මීටර් 30ක් උස සමෝච්ච රේඛාව දක්වා විහිදෙන ප්‍රදේශය ………………………… වේ.
(වෙරළබඩ තැනිතලාව/ මධ්‍යම කඳුකරය/ අභ්‍යන්තර තැනිතලාව)
3) වයඹ ගිනිකොණ දිශානුගත ව විහිදෙන රක්වාන කඳු හා බුලුතොට හෙල් ………………………… වේ.
(ශේෂ කඳු/ සමාන්තර හෙල් වැටි/ කඳු මුදුන්)
4) කෘෂිකාර්මික නොවන කාර්යයන්හි නියැලෙන පිරිස් බහුලව දක්නට ලැබෙන ජනාවාස ………………………… ජනාවාස වේ.
(ග්‍රාමීය/ නාගරික/ ගැමිනාගරික)
5) කහ ගඟ නිම්නය ආශ්‍රිතව බිහි වූ ශිෂ්ටාචාරය වන්නේ …………………………………………
(හොවැංහෝ ශිෂ්ටාචාරය/ යුප්‍රටීස් ටයිග්‍රීස් නිම්නය/ මෙසපොතේමියානු ශිෂ්ටාචාරය)

★ **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

6) වලවේ ගඟ හරස්කර වික්ටෝරියා ජලාශය ඉදිකර තිබේ. ( )
7) පාකිස්ථානයේ රාබි ප්‍රධාන වගා කන්නය නොවැම්බර් සිට මාර්තු දක්වා වේ. ( )
8) “Dubai Mall” නමින් හැඳින්වෙන ලෝකයේ විශාලතම වෙළඳ මධ්‍යස්ථානය ඉන්දියාවේ පිහිටා ඇත. ( )
9) සමාන්තර ව විහිදුණු හෙල් වැටි, ශේෂ කඳු, ගංගා, පිටාර තැනි හා තැනිතලා අභ්‍යන්තර තැනිතලාවේ විශේෂ ලක්ෂණ වේ. ( )
10) එරමිණියා කිවුල් දියට අනුවර්තනය වූ ශාක විශේෂයකි. ( )

★ **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11) ශ්‍රී ලංකාවේ වාරි පද්ධති බහුලව දක්නට ලැබෙන දේශගුණික කලාපය වන්නේ
   i. වියළි කලාපය
   ii. තෙත් කලාපය
   iii. වෙරළබඩ කලාපය
   iv. කඳුකර කලාපය

12)ජල සම්පතින් පොහොසත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා නිම්න කීයද?

i. 18 ii. 50 iii. 255 iv. 103

13)කිසියම් ස්ථානයක කෙටි කාලයක් තුළ එම ස්ථානය ආශ්‍රිතව පවතින වායුගෝලීය තත්ත්වය හඳුන්වන්නේ

i. දේශගුණය යනුවෙනි ii. වායු පීඩනය යනුවෙනි

iii. කාලගුණය යනුවෙනි iv. උෂ්ණත්වය යනුවෙනි

14)වාෂ්පීකරණය අධික දේශගුණික කලාපය වන්නේ

i. කඳුකර වියළි කලාපය ii. අර්ධ ශුෂ්ක කලාපය

iii. පහතරට වියළි කලාපය iv. තෙත් කලාපය

15)රටක ආර්ථික සංවර්ධනය මෙන්ම සමාජීය සංවර්ධනයක් ද ඇති විය යුතුය. සමාජීය සංවර්ධනය විය යුත්තේ ආහාර, පෝෂණය, සෞඛ්‍යය, අධ්‍යාපනය, නිවාස, සමාජ සුරක්ෂිතභාවය, ඇඳුම් - පැලඳුම්, විවේකය හා මානුෂ නිදහස යනාදියයි යන ප්‍රකාශය කරන ලද්දේ

i. රුම්සා සම්මුතිය
ii. යුනෙස්කෝ සංවිධානය
iii. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
iv. යුනිසෙෆ් සංවිධානය

**පහත "අ" තීරුවේ දැක්වෙන ගංගා ගලා බසින සාගර හෝ මුහුද "ආ" තීරුවෙන් තෝරා ඊට හිමි අක්ෂරය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

| | | |
|---|---|---|
| 16)යෙනිසි, ලීනා | (……………) | A. ඉන්දියන් සාගරය |
| 17)අමුර්, හොවැංහෝ | (……………) | B. ආක්ටික් සාගරය |
| 18)ඉන්දු, මීකොං | (……………) | C. පැසිපික් සාගරය |
| 19)යුප්‍රටීස්, ටයිග්‍රිස් | (……………) | D. ඒරල් මුහුද |
| 20)සර්ඩේරියා, අමුඩේරියා | (……………) | E. පර්සියන් බොක්ක |

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01)(අ) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. ආසියානු කලාපයේ ජීවත් වන මානව වර්ග දෙකක් ලියන්න. (ල 2)

ii. ආසියානු කලාපයේ ජන හීන ප්‍රදේශ දෙකක් ලියන්න. (ල 2)

iii. ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධකයක් ලියන්න. (ල 1)

iv. සුළඟේ තීව්‍රතාව අනුව වායු කැළඹීම්, අවපාත, සුළි කුණාටු ආදී නම් වලින් හඳුන්වන සුළං සහිත වර්ෂාවේ නම ලියන්න. (ල 1)

v. ශ්‍රී ලංකාවේ සංවහන ක්‍රියාවලියේ කැපී පෙනෙන අවස්ථා දෙක ලියන්න. (ල 1)

vi. මධ්‍යම කඳුකරය තුළ උස් මුදුන් සහිත ප්‍රධාන කඳු පන්තියක් ලියන්න. (ල 1)

vii. ආසියාවේ ඉහළ උෂ්ණත්වයක් වාර්තා වන්නේ කුමන ප්‍රදේශයකින් ද? (ල 1)

(ආ) ආසියානු මහද්වීපයේ දක්නට ලැබෙන පහත සඳහන් භූ විෂමතා ලක්ෂණ වලට උදහරණ දෙක බැගින් ලියන්න. (ල 4)

i. සානු

ii. තැනිතලා බිම්

(ඉ) ආසියානු ප්‍රදේශයේ සුවිශේෂත්වයට බලපෑ කරුණු තුනක් ලියන්න. (ල 3)

02)

i. උෂ්ණත්ව ව්‍යාප්තියේ පවතින වෙනස්කම් අනුව පෘථිවිය බෙදෙන ප්‍රධාන දේශගුණ කලාප තුන ලියන්න. (ල 3)

ii. එම එක් එක් දේශගුණ කලාපවල ව්‍යාප්ත ස්වභාවික වෘක්ෂලතා ප්‍රභේද මොනවාදැයි සඳහන් කරන්න. (ල 4)

iii. ඉහත සඳහන් කළ එක් එක් ස්වාභාවික වෘක්ෂලතා ප්‍රභේදය තුළ වැඩෙන සත්ව විශේෂ 2 බැගින් නම් කරන්න. (ල 4)

03)

i. ජනාවාසයක් යනු කුමක්ද? (ල 3)

ii. ජනාවාස ප්‍රධාන වශයෙන් කොටස් කීයකට බෙදේ ද? ඒවා මොනවාද? (ල 4)

iii. බස්නාහිර පළාතේ ජන සංඛ්‍යාව වැඩි වීමට බලපාන හේතු හතරක් සඳහන් කරන්න. (ල 4)

04)

i. 1:50 000 භූ ලක්ෂණ සිතියමක දැක්වෙන භෞතික ලක්ෂණ දෙකක් සංස්කෘතික ලක්ෂණ දෙකක් බැගින් ලියන්න. (ල 4)

ii. පහත දැක්වෙන සංස්කෘතික ලක්ෂණ වලට අදළ සංකේතය ඇඳ නියමිත වර්ණ යොදන්න.

- තැපැල් කාර්යාලය
- ක්‍රිස්තියානි පල්ලිය
- තේ වගාව
- පාසල
- රෝහල

(ල 5)

iii. ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල පමණක් දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණ දෙකක් ලියන්න. (ල 2)

05)

i. පහතරට තෙත් කලාපයේ විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල 3)

ii. පහතරට තෙත් කලාපීය වනාන්තරවල වැඩෙන ප්‍රධාන ශාක වර්ග හතරක් ලියන්න. (ල 4)

iii. කඩොලාන වෘක්ෂලතාවල ලක්ෂණ දෙකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල 4)

06)

i. ආසියාවේ මෙන්ම ලෝකයේ ප්‍රධාන කාර්මික රට කුමක්ද? (ල 1)

ii.

a) එම කාර්මික රටෙහි ප්‍රධාන මෝටර් රථ නිෂ්පාදන සමාගම් දෙකක් ලියන්න. (ල 2)

b) පාකිස්ථානය ලෝක වෙළඳපොළට සපයන නිෂ්පාදන දෙකක් ලියන්න. (ල 2)

iii.

a) ජපානයේ පෙට්‍රෝ රසායන කර්මාන්ත තුනක් ලියන්න. (ල 3)

b) ඩුබායි ආසියාවේ සේවා මධ්‍යස්ථානයක් ලෙස වැදගත් වීමට බලපෑ කරුණු තුනක් ලියන්න. (ල 3)

07)

i. යටිතල පහසුකම් යනු මොනවාද? (ල 2)

ii. මාර්ග ප්‍රවාහන ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා මෑතකාලීන රජයන් විසින් ගෙන ඇති පියවර හතරක් ලියන්න. (ල 4)

iii. වන ජීවීන්ගේ වාසස්ථාන අහිමි වීම් නිසා මිනිසාට ඇතිවන බලපෑම් දෙකක් විස්තර කරන්න. (ල 5)